# බලන්ගොඩ නගර සභාව

## 2021-01-12 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.01.12**

**වේලාව - පෙ.ව. 10.20**

**බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021 වර්ෂයේ මංගල සභා රැස්වීම අද දින පවත්වන බවද 2020-12-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2020-12-16 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව, 2020-12-24 දින පැවති අඩාලව කල් තබන ලද සභා වාර්තාව සත්‍යය වාර්තාව බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉහත සභා වාර්තා තුන සභා සම්මත කරගන්නා ලෙස පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් පළමුව ගන්නේ කුමන සභා වාර්තාව දැයි විමසන ලදී.

පළමුව මහ සභා වාර්තාව, විශේෂ මහ සභා වාර්තාව හා අඩාලව කල් තබන ලද සභා වාර්තාව ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් සභා වාර්තා තුනම එක වර සභා සම්මත කරන්නේදැයි විමසන ලදුව ගරු සභාපතිතුමා විසින් එසේ සිදු කර සභා වාර්තාවල සංශෝධන ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

එම අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2021 වර්ෂයේ අයවැය සභාවේ පරාජය කළ බැවින් සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යන්නේ කෙසේදැයි විමසන ලදී. එමෙන්ම දෙවන වර අයවැය ඉදිරිපත් නොකර සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යන්නේ කෙසේදැයි විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා උගත් බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් ලෙස පනත පරිදි අයවැය ලේඛනය සභාවේ සම්මත කර ඇති බව තේරුම් ගන්නා ලෙස ද මෙම ප්‍රශ්නය ලංකාව පුරාම පවතින බවද පැවසීය. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද අමරවීර මැතිතුමා විසින් එතුමාගේ කොට්ඨාශයේ ද මෙම ගැටළුව පැන නැඟී ඇති බව ද එම අවස්ථාවේදී එතුමා නීත්‍යානුකූලව අයවැය සම්මත බැවින් ගැටලුවක් නොමැති බව ද පැවසූ අතර අප සභාවේ අයවැය සම්මත බැවින් ඉදිරියට සභාවේ කටයුතු සහයෝගයෙන් කරගෙන යමුයි යනුවෙන් ද පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටියේ එතුමා පවසන්නේ එතුමාගේ ඡන්ද කොට්ඨාශය පිළිබඳව වන නමුත් මෙය බළන්ගොඩ නගර සභාව බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙතන වාර්තා තුනක් පවතින අතර පසුගිය සභාවේදී කථා කරන විට රෙකෝඩරය ගරු සභාපතිතුමා ළගින් තබා කථා කළ බවද එබැවින් මෙය නිවැරදිව වාර්තා කරන ලෙසද ලේකම්තුමියට පවසන ලදී. එමෙන්ම මන්ත්‍රීවරුන් කථා කරන විට අදාළ මන්ත්‍රීවරයා අසළට රෙකෝඩරය තබන ලෙසද සභා වාර්තා තුන අතුරින් විශේෂ මහ සභා වාර්තාව පළමුව සංශෝධනයට ගත යුතු බවද මහ සභාවේ සභා වාර්තාව ඊට පසුව ගත යුතු බවද පැවසූ අතර තමන් මෙන්ම තම පක්ෂය විසින් සභාපතිතුමා සභාපති ලෙස පිළිනොගන්නා බවද පවසන ලදී.

එහිදී ගරු සභාපතිතුමා විසින් අදහස් ප්‍රකාශ කිරීමට සූදානම් වූ අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසූයේ මෙය සාවදානව අසා සිටින ලෙසත් සාවදානව පිළිතුරු ලබා දෙන ලෙසත් ය. එබැවින් ගැටුමකට යාම අවශ්‍ය නොවන බව ද පනත පරිදි නීති පරිදි හෝ නීතිපතිගේ උපදෙස් පරිදි කටයුතු කරන බව ද එහි ප්‍රශ්නයක් නොමැති බව ද පැවසූ අතර ගරු සභාපතිතුමා ඉදිරියට සභාපති බව පවසන්නේ නම් එය ගැටලුවක් බවද පසුගිය සභාවේ දී ගරු සභාපතිතුමා අයවැය සම්මත යැයි කියා පැවසුව නමුත් එය බල රහිත කරන ලද බවද පසුගිය අයවැය සභාව ද එසේම වන බවද විශේෂ මහ සභාවේ සංශෝධන ගෙන ඒමේ අවස්ථාව මෙය බවද එහි සංශෝධන පැවසීමට පෙර සියලු දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

නමුත් ඇතැමුන්ට මෙය සුභ නව වසරක් නොවන බවද මෙය ලෝක දහම අනුව වන දෙයක් බවද සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ පියවරුන් දෙදෙනෙක් ගිය වසර අවසාන වන විට අභාවයට පත් වූ අතර ඒ පිළිබඳව ශෝකය පළ කරන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා මාධ්‍යවේදීන් ද සභාවේ අයට උදව් කරන බවද සභාවේ මින් ඉදිරියේ කිසි දෙයක් අනුමත නොකරන බව ද පවසන ලදී.

ඒ සමගම ගරු සභාපතිතුමා එසේ කල නොහැකි බව පවසන අවස්ථාවේදීම ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසින් සභාවේ කෑ කෝ ගසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසූයේ තමන් විශේෂ මහ සභාවේ සංශෝධන ඉදිරිපත් කරන බවද සභාපතිතුමා ගියවර හා ඊට පෙර සභා වාරයේ දීත් සභාව නොමඟ යැවූ බවයි. එවිට ගරු සභාපතිතුමා අදහස් ප්‍රකාශ කිරීමට සූදානම් වීමේදී තමන් අදහස් ප්‍රකාශ කරන තෙක් සිට පිළිතුරු ලබා දෙන ලෙස ද නිකරුනේ බලු පොරයකට වැටීමට අවශ්‍ය නොවන බවද බළන්ගොඩ නගරයේ ජනතාවගේ ඡන්දය තම පක්ෂයට බලය ලබා ගැනීමට ලබා දුන් බවද අනුන්ගේ බත් පිඟානක් උදුරගෙන කාලා ඒ මදිවට තවත් කන්නනේ ඉල්ලන්නේ යනුවෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසීමත් සමඟ ගරු සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අතර අදහස් හුවමාරුවක් ඇති විය.

අනතුරුව සභාවේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු මේ සමඟ සම්බන්ධවීමත් සමඟ සභාව තුල ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

නැවත අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා ගරු සභාපතිතුමාම අයවැය පරාජය බවට ප්‍රකාශ කර ඇති බව පවසා සිටි ඇති බවද එනම් "2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතට අනුව මා විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයට සභාවෙන් ඉදිරිපත් වූ යෝජනා හා සංශෝධන සියල්ල ගරු සභාව විසින් පරාජය කිරීම තුළ" යනුවෙන් සටහන්ව ඇති බවද පවසන ලදී.

එහි දී ගරු සභාපතිතුමා පවසා සිටියේ ඒ සඳහන්ව ඇත්තේ සංශෝධනය පරාජය කිරීම බව පවසන ලද බවයි.

එවිට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පවසා සිටියේ එය පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දෙන බවයි.

එම අවස්ථාවේ ගරු සභාපතිතුමා පවසා සිටියේ සෑම විටම ඔබතුමන්ලා තම තමන්ගේ මතය දරන බවයි.

එහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අද දින සභාව ආරම්භ කිරීමට විනාඩි 22 ක් ප්‍රමාද වූ අතර තම පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දුරකථන ඇමතුම් ලබා දුන් බවද එදා මන්ත්‍රීවරුන් සභාවට පැමිණීමට පෙර සභාව ආරම්භ කරන ලද බව ද පවසන ලදී.

එමෙන්ම සභාව ගෙනයාමට අවශ්‍ය නම් තම පක්ෂය කියන දේ අහන ලෙසද තමන් සභා වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කරන බවද සභාපතිවරයා වෙනස් වීම තමන්ට අදාල නොවන බවද එය වෙනස් වන්නේ නම් වෙනස් වනු ඇති බවද සංශෝධනය ගෙන ඒමට මෙච්චර බය නම් අනිත් ඒවාට කොච්චර දඟලයිද යි විමසන ලදී.

නැවතත් ගරු සභාපතිතුමා හා මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විසින් අදහස් දැක්වීම නිසා සභාව තුල ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අද මේ රට වෙලාගෙන තිබෙන අවනීතිය අසාධාරණය අයුක්තියට එරෙහිව කටයුතු කරන බවයි.

නැවතත් සභාවේ කිහිපදෙනෙකු අදහස් දැක්වීම නිසා සභාවේ සභාව තුල ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් තමන් සභාවේ සංශෝධනයක් ඉදිරිපත් කරන බැවින් ඒ සඳහා ඉඩ ලබා දෙන ලෙස පවසන ලදී. ඒ අනුව විශේෂ මහ සභා වාර්තාවේ "සම්පූර්ණ සභාවේ කටයුතුවලට හා දියුණුවට දායකවන්නේ සභාපතිවරයා බවද, කෙන කෙනාගේ නැණ පමණින් සෑම දෙයක්ම අවබෝධ කරගන්නා" බව සටහන්ව ඇති බවද එම නැණ පමණින් තමන් කථා කරන බවද මෙම අයවැය පරාජය වී ඇති බව මෙහි පවතින බවද 2019 වර්ෂයේ අයවැයද පරාජය කළ අතර 2020 අයවැය පරාජය කළ නමුත් මෙය සභාවේ රෙකෝඩරය ළඟින් තබා ගෙන කළ වැඩක් බවද බහුතරය සභාපතිතුමාට විරුද්ධ බවද සභාපතිතුමාගේ පක්ෂයේ අයවත් සභාපතිතුමාට නොමැති බවද පවසන ලදී.

එම සභා වාර්තාවේ "ඒ සඳහා කිසිඳු සංශෝධනයක් සිදු කළ යුතු නොවන බවත් ගරු සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලද බවත්" යනුවෙන් සටහන්ව ඇති බවද ඒකමතිකව සභාවේ සංශෝධන ගෙන ඒම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කර තිබෙන්නේ කොහිදැයි යන්න විමසන ලදී.

ඒ පිළිබඳව නැවත ගරු සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අතර අදහස් හුවමාරු වීමක් ඇති වීම තුල ඉතා ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

නැවත අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා සභා වාර්තාවේ ඒකමතිකව සම්මත වී ඇති බව සටහන්ව ඇති අතර එය පට්ටපල් බොරුවක් බවද එබැවින් සංශෝධන ගෙන ආ බවද පවසන ලදී.

නැවත ගරු සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අතර අදහස් හුවමාරු වීමක් ඇති විය.

එමෙන්ම විශේෂ මහ සභා වාර්තාවේ "අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් අයවැය අවසානයේ රු. 8,000.00 ක මුදලක් පමණක් ඉතිරිවන අතර ලක්ෂ 05 - ලක්ෂ 10 දක්වා වැඩි කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය මුදල් සපයා ගන්නේ කෙසේදැයි විමසන ලදී. එයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ එය තමාට කළමනාකරණය කර ගත හැකි බවයි." යනුවෙන් සටහන් ව ඇති අතර සභාවේ තිබෙන්නේ මහජනතාවගේ මුදල් බවද ඒ මුදල් කළමණාකරණය කිරීමට පුළුවන් බවට පිළිතුරු ලබා දීම ප්‍රමාණවත් නොවන බව පවසන ලදී.

නැවත ගරු සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීවරුන් අතර අදහස් හුවමාරු වීමක් ඇති විය.
අනතුරුව ගරු සභාපතිතුමා විසින් පෙ.10.40ට පමණ ගරු සභාව පැයකට පමණ කල් තබන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.40 ට පමණ සභාවට පැමිණෙන ලදී.

නැවත පෙ.ව11.49 ට පමණ සභාව ආරම්භ කරමින් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා නැවතත් අඩාලව කල් තබන ලද ස්ථානයෙන්ම සභාව ආරම්භ කිරීමට නියමිත බව පවසද්දීම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පනත හොඳින් අධ්‍යයනය කරන ලෙසද 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධි විධාන පනතේ වගන්තිය "එසේ වුව ද, නිල කාලය ආරම්භ වී වසර දෙකකින් ඉක්බිතිව සභාපතිවරයා විසින්, කවර හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ 178 වන සහ 178 (අ) වගන්ති අනුව කටයුතු කිරීමෙන් අනතුරුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයේ සියලුම විෂයයන් හෝ යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එකතු කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම් ඔහු විසින් එම අයවැය ලේඛනය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතුය. එය එසේ දෙවන වරටත් ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුලත සම්මත කරනු නොලැබූ අවස්ථාවක එකී සති දෙකක කාලය අවසන් වීමෙන් පසුව සභාපතිවරයා ස්වකීය සභාපති ධූරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලැබිය යුතුය" යනුවෙන් පවසන ලදී. එහි දී එම පනතේ එම වගන්තිය

තේරුම් කර දීම සඳහා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගෙන් එම කියවා බැලූ කඩදාසිය ඉල්ලා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා ගරු සභාපතිතුමා එය අධ්‍යයනය කරන තෙක් සභාපතිතුමාගේ ක්‍රියාව වෙනුවෙන් විරෝධය ගරු සභාවේ පළ කරන බව පවසමින් විවිධ වැකි ලියූ බිසිල් බෝඩ් අල්ලා සභාවේ නැගී සිටින ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් සභාවේ බොරු විරෝධතා නොපවත්වන ලෙසද මහජනතාවට සේවය කරනු බදු ගෙවන ජනතාව වෙනුවෙන් සේවයක් මෙම ආයතනයෙන් ඉටු කරන බවද සේවයක් කරන විට සේවයද බලයද යන්න සිතිය යුතු බවද සභාවේ වසර තුනක් පමණ සිටි අතර මිනිසුන්ට වැඩ කිරීමේදී කිසිඳු ප්‍රශ්නයක් සිදු වී නොමැති බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් එය සභාපතිතුමාගේ අදහසක් පමණක් බවද සභාවේ බහුතරය තම පක්ෂයට පවතින බැවින් මහජනතාවට සේවය කිරීම වෙනුවෙන් බහුතරය සමඟ සිටිය යුතු බවද ගරු සභාපතිවරයාට බහුතරය නොමැති බව සභා වාර්තාවල සටහන් වී තිබෙන බව ද පවසන ලදී. එම අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් එසේ තමන් ප්‍රකාශ කර නොමැති බව පවසද්දීම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් තමන් සභා වාර්තාවල එය පෙන්වන්නදැයි විමසන ලදී.

එහිදී ගරු සභාපතිතුමා විසින් එය කොහොම කෙසේ වුවද පනතත් සමඟ කටයුතු කරගන යා යුතු බව පවසන ලදී. එමෙන්ම විෂයක් සුළුවෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ සංශෝධනය කරන්නේ නම්, සුළුවෙන් සංශෝධනයක් කරන්නේ නම් ගරු සභාපතිවරයා එය පිළිගන්නේ නම් ගැටළුවක් නොවන බවද පවසන ලදී.

මෙම අවස්ථාවේ දී සභාවේ මන්ත්‍රීවරුන් විසින් කෑ ගසන ලද අතර එහිදී ගරු සභාපතිතුමා විසින් තමන් මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදුන් ලෙසම තමන්ටද අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසපවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් ගරු සභාපතිතුමා එසේ කථා කිරීමට අවස්ථා ලබා නොදුන් බව පවසන ලදුව ගරු සභාපතිතුමා විසින් පවසා සිටියේ එම අවස්ථාවේදී ඔවුන් වෙන දේවල් කථා කරන ලද බවයි.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් සභා වාර්තාවේ සංශෝධනයන් ගෙන ආ බව පවසද්දීම ගරු සභාපතිතුමා පවසා සිටියේ සභා වාර්තාවේ සංශෝධනය නොමැතිව මින් ඉදිරියට කිසිඳු දෙයක් අනුමත නොකරන බව ඔබතුමන්ලා පැවසූ බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් එසේ අනුමත කරන්නේ කොහොමද යනුවෙන් විමසන ලදී.

එහිදී ගරු සභාපතිතුමා විසින් එසේ අනුමත කිරීමට පෙර සභාවේ ඉතිරි වැඩ ටික කරගෙන යමුයි පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් 2020-12-14 දින ඉදිරිපත් කළ අයවැය පරාජය වී ඇති බව තමන් දන්න සිංහලෙන් පැවසූ බව සඳහන් කරන ලදි.

එහිදී ගරු සභාපතිතුමා විසින් එසේ පරාජය වී නොමැති බව පැවසීමත් සමඟම සභාවේ මන්ත්‍රීවරුන් විසින් කෑකෝ ගසන ලදී. මෙහි දී ඇති වූ සෝෂාකාරී වාතාවරණය තුල සභාව තවදුරටත් පවත්වාගෙන යාම නොහැකි වීම මත සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි බැවින් පෙ.ව.11.56ට පමණ ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අඩාලව කල් තබන ලදී.

චමික ජයමිණ විමලසේන,<br>
සභාපති,<br>
බළන්ගොඩ නගර සභාව.